2nd International Conference of Multidisciplinary Approaches (iCMA), 2015
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka

ISSN: 2386 – 1509
Copyright © iCMA


# නුවර කලාවියේ මුට්ටි මංගල්‍යයේ සන්නිවේදන ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්.ඩී.පී.විජේරත්න

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයල නුගේග ොඩ

*wdpdilhani@gmail.com*

නුවර වැව, කලා වැව හා පදවි වැව කේන්ද්‍ර කොටගත් වත්මන් අනුරාධපුර දිස්ත්‍රික්කයට මහනුවර යුගයේ සිට නුවරකලාවිය නමින් ව්‍යවහාර කොට තිබේ. එවක පටන් නුවරකලාවිය පළාත්, කෝරල හා තුලාන් වශයෙන් පාලනය වූ අතර විවිධ පරිපාලකයන් යටතේ වෙනස්වීම්වලට බඳුන් වී ඇත. නුවරකලාවියේ ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකර්මාන්තයට මෙන්ම විවිධ වූ අවශ්‍යතා ඉටුකර ගැනීමට ඔවුන්ට උපකාර වන්නේ වැවයි. එම නිසාම වැව හා නුවරකලාවිය ජනයා අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවකි. ඒ හා බැඳුණු සංස්කෘතික අගනාකම් ප්‍රමාණයද අතිමහත්ය. නුවරකලාවිය ජනයාගේ වැව හා බැඳුණු පූජාවිධි අතර මුට්ටි මංගල්‍යයට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. වැව කේන්ද්‍ර කොට ගෙන වැවේ ආරක්ෂාව, වැව් ගම්මානවල ආරක්ෂාව හා කෙතේ ආරක්ෂාව පතා සිදුකරන්නා වූ පූජාවකි මුට්ටි මංගල්‍යය. අයියනායක දෙවියන් මුල්කොට ගනිමින් මුට්ටි මංගල්‍යය සිදු කළද ඉලන්දාරී, කඩවර, පුල්ලයාරේ යන දෙවිවරු මෙන්ම වෙනත් ප්‍රාදේශීය දෙවිවරු උදෙසාද කන්නලව් කොට පූජා පැවැත්වෙන බව පෙනේ.

මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වන්නේ නුවරකලාවිය මුට්ටි මංගල්‍යයේ සන්නිවේදන ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා නුවරකලාවියේ මුට්ටි මංගල්‍යයෙන් හෙළිවන සන්නිවේදන ලක්ෂණ මොනවාද? යන ගැටලුව පාදක කොට ගෙන සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය හා නිරීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ ඒකරාශී කරගත් දත්ත ගුණාත්මකව විශ්ලේෂණය කරන ලදී.

'යමෙක්, යම්කිසිවක්, කිසියම් නාලිකාවකින්, යම් කෙනෙකුට, යම් බලපෑමක් ඇතිකිරීම උදෙසා ප්‍රකාශ කරයි ද එය සන්නිවේදනය ලෙස හැරල්ඩ් ඩී. ලැස්වෙල් හඳුන්වයි.' ඒ අනුව සන්නිවේදකයා, පණිවුඩය, මාධ්‍යය, ග්‍රාහකයා, බලපෑම යන මූලිකාංග කෙරෙහි අවධානය යොමු කරන අතර මුට්ටි මංගල්‍යය සන්නිවේදනයේ දීද මංගල්‍යයට බාරවීම, මංගල්‍යයට සූදානම් වීම, මංගල්‍යය පැවැත්වීම හා මංගල්‍යයෙන් පසු අවස්ථාව යන ප්‍රධාන අදියරයන්හී දී සන්නිවේදනය කරන්නා වූ ප්‍රබල සන්නිවේදන ලක්ෂණ රැසක් හමුවෙයි. එනම්, අන්තර්වර්ථී පුද්ගල සන්නිවේදන ලක්ෂණ, පුද්ගලාන්තර සන්නිවේදන ලක්ෂණ, සමූහ සන්නිවේදන ලක්ෂණ, අධිභෞතික සන්නිවේදන ලක්ෂණ මෙන්ම සංකේත භාවිතය, ශ්‍රව්‍ය සන්නිවේදන ලක්ෂණ, දෘශ්‍ය සන්නිවේදන ලක්ෂණ යනාදියයි. මෙම  පූජාකර්මය ආරම්භයේ සිට අවසානය දක්වාම ගම්වැසියෝ සෞභාග්‍යය ප්‍රාර්ථනා කරති. මෙය අන්තර්වර්ථී සන්නිවේදන ලක්ෂණයකි. මුට්ටි මංගල්‍යයේ දී සාමූහිකව තීරණ ගැනීම, වගකීම් පැවරීම, වගවීම, විසම්මුතිය යනාදී සමූහ සන්නිවේදන ලක්ෂණ හඳුනාගත හැකිවිය. අනුමැතිරාළ හා දෙවියන් සමඟ සිදුකරන සන්නිවේදනය මුට්ටි මංගල්‍යයේදී අධිභෞතික ලක්ෂණ පෙන්නුම් කරයි. තවද, මුට්ටි මංගල්‍යයේදී දෙවියන් සංකේතවත් කිරීමට යොදාගන්නා අණාභරණ, සශ්‍රීකත්වය සංකේතවත් කිරීමට යොදා ගන්නා මුට්ටි, ප්‍රබල සන්නිවේදන ලක්ෂණ පිළිබිඹු කරන අතර කෝල්මුර හා යාදිනි මෙන්ම ශබ්ධ පූජාවෙන් ශ්‍රව්‍ය සන්නිවේදන ලක්ෂණ ද කිරි ඉතිරීම, මුට්ටි නැමීම වැනි අවස්ථාවලින් දෘශ්‍ය සන්නිවේදන ලක්ෂණද විදහා දක්වන බැව් අධ්‍යයනයෙන් විද්‍යමාන විය. මෙකී සන්නිවේදන ලක්ෂණ මනාව හඳුනාගෙන භාවිත කිරීමෙන් සංවර්ධන සන්නිවේදනයට සඵලදායීව යොදාගත හැකිය.

ප්‍රමුඛ පද : නුවරකලාවිය, වැව, මුට්ටි මංගල්‍යය, සන්නිවේදන ලක්ෂණ

**Keywords:** *Nuwarakalaviya, Tank, Mutti Mangallya, Communication Features*